# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.01-03

පැමිණිලි පාර්ශවය : පො.ප දයානන්ද අලහප්පෙරුම මයා,
අංක 01/ඩී, කුරුදුගොල්ල,
වැරැල්ලගම, අලදෙණිය.

වගඋත්තර පාර්ශවය : එච්.ඒ.එන්.කේ දමයන්ත විජය ශ්‍රී මයා,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/අධ්‍යක්ෂ,
පොලිස් සුභසාධක කොට්ඨාශය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : **HRC/K/109/19**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා කොළඹ පොලිස් මූලස්ථානයේ පිහිටි ගොඩනැගිලි කොට්ඨාශයට අනුයුක්තව නුවරඑළිය රාජ්‍ය නිවේදිත නිලධාරී නිවස්නයේ නිවස්න භාරකරු ලෙස සේවය කරන බවත්, මෙම නිවාඩු නිකේතනයට සේවයේ නියුතු උසස් පොලිස් නිලධාරීන් හා විශ්‍රාම ගිය උසස් නිලධාරීන් නිවාඩු ගතකිරීම සඳහා පැමිණෙන බවත්, ඒ අනුව 2019.02.25 වන දින රාත්‍රී පැය 21.30 ට කොළඹ සුභසාධන කොට්ඨාශයේ හා අශ්වාරෝහක කොට්ඨාශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දමයන්ත විජය ශ්‍රී මහතා හා ඔහුගේ පවුලේ අය දින 03 ක නිවාඩුවක් සඳහා මෙම ස්ථානයට පැමිණි බවත්ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එදින රාත්‍රී ආහාරය සකස් කිරීම සඳහා ඌරු මස් ඇතුළුව අනෙකුත් බඩු රැගෙන එන ලද අතර, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීගේ අරක්කැමි රාජකාරියේ යෙදී සිටි පො.කො 65673 රොබට් යන නිලධාරියා

නිවස්නයේ ඉහළ මාලයට කැඳවා රැගෙන එන ලද ඌරු මස් කි.1 පිළියෙල කරදෙන ලෙස පවසා ඇති බවත්, ඒ අනුව ලබාදෙන ලද ඌරු මස් පිස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දමයන්ත මහතාගේ පවුලේ අය හට රාත්‍රී ආහාරයට ලබා දුන් බවත්, පසුව මත්පැන් පානය කරමින් සිට ආහාර ගැනීම සඳහා පැමිණි දමයන්ත මහතා එක්වරම මුළුතැන්ගෙට පැමිණ ඌරු මස් අඩු බව පවසමින් මුළුතැන්ගෙන පරීක්ෂා කළ බවත් සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී අවේගශීලීව කටයුතු කළ එම මහතාට කරුණු පැහැදිලි කරදීමට තමා ගිය අවස්ථාවේදී අසභ්‍ය වචනයෙන් බැණවැදී තමාගේ දකුණු කම්මුල වෙත අතින් පහරදුන් බවත්, එම පහර වැදී තමා විසිවී ගොස් ඒ ආසන්නයේ හිරමනය සවිකර ඇති මේසයේ වැදී තමාගේ දකුණු අතේ වැලිමිට පහල කොටස තුවාල වූ බවත් එම පහරදීම එම අවස්ථාවේ අරක්කැමි ලෙස සිටි රොබට් නිලධාරියාද දුටු බවත් සඳහන් කර ඇත.

පසුව තමා මෙම පහරදීම සම්බන්ධයෙන් නිවස්නයේ ඇති දෛනික තොරතුරු පොතේ සටහන් කර එදිනට පසුදින 2019.02.28 දින නුවරඑළිය රෝහලේ වාට්ටු අංක 06 ට ඇතුළත් වී දින 02 ක් ප්‍රතිකාර ලබාගත් බවත්, දියවැඩියාව හා හෘද රෝගයෙන් පෙලෙන තමාට මෙසේ තුවාල කිරීමත්, අසභ්‍ය වචනයෙන් බැණ දරුණු ලෙස පහරදීමෙන් තමා දැඩි අපහසුතාවයට පත්වූ බවත්, එබැවින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා තමාට සාධාරණයක් ඉටුකර දෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-**

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවීය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දමයන්ත විජය ශ්‍රී මහතා විසින් යොමුකර ඇති වාර්තාවේ සඳහන්ව ඇත්තේ, පැමිණිලිකාර නුවරඑළිය රාජ්‍ය නිවේදිත නිලධාරී නිවස්නයේ භාරකරු ලෙස සේවය කරන ඩී. අලහප්පෙරුම යන අය විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ල සම්පූර්ණයෙන් අසත්‍ය බව වගකීමෙන් ප්‍රකාශ කරන බවයි.

මෙම නිවස්නය ඉතා අපිරිසිදුව හා නොසැළකිලිමත්ව නඩත්තු කිරීම සම්බන්ධයෙන් තමා එහි භාරකරු ලෙස සේවය කරන පැමිණිලිකරු වෙත වාචිකව අවවාද කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ද දැනුවත් කර ඇති බවත්, තමාගේ රාජකාරී පැහැරහැරීම සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියෙකු විසින් ලිඛිතව සටහනක් තැබීමෙන් එය තමන්ගේ රාජකාරියට ගැටළුවක් වේ යැයි පූර්ව

උපකල්පනයකට පැමිණ ව්‍යාජ සාක්ෂි ගොඩනගා තමාට එරෙහිව ද්වේශයෙන් මෙම පැමිණිල්ල සිදුකර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස නුවරඑළිය රාජ්‍ය නිවේදිත නිලධාරී නිවස්නයේ භාරකරු වශයෙන් කටයුතු කර ඇති අතර, වගඋත්තරකාර පොලිස් නිලධාරී සිය පවුලේ සාමාජිකයින් සමඟ නිවාඩු නිකේතනයේ නවාතැන් ගෙන ඇති බවත්, 2019.02.27 වන දින රාත්‍රී ආහාරය සඳහා ඔහු විසින් ගෙන යන ලද ඌරුමස් රාත්‍රී ආහාරය සඳහා සකස් කර ඇති බවත්, රාත්‍රී ආහාර ගන්නා අවස්ථාවේ පිසින ලද ඌරු මස් ප්‍රමාණය අඩු බව පවසා අරක්කැමි නිලධාරීට බැණවැදී ඇති අතර, එම අවස්ථාවේ පැමිණිලිකරු එම ස්ථානයට ගොස් කරුණු පැහැදිලි කර දුන් බවටත් කරුණු ඉදිරිපත් වී ඇත.

එම අවස්ථාවේ අධික ලෙස කෝපයට පත්ව සිට ඇති වගඋත්තරකාර පොලිස් නිලධාරියා පැමිණිලිකරුට අසභ්‍ය වචනයෙන් බැණවැදී කම්මුලට පහරදී තල්ලු කිරීමේදී පැමිණිලිකරු විසිවී ගොස් හිරමණයක් සවිකර ඇති මේසයේ වැදීම හේතුවෙන් තුවාල සිදුවී ඇති බවට සඳහන්ව ඇත.

මෙම පහරදීම හේතුවෙන් පැමිණිලිකරු නුවරඑළිය මහ රෝහලට ඇතුළත්ව දින කිහිපයක් ප්‍රතිකාර ලබාගෙන ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරුගේ දකුණු කම්මුලේ ත්‍රිකෝණ හැඩැති විශ්කම්භය 1×2 ප්‍රමාණයේ සිරීමක් හා දකුණු වැලමිටේ සෙ.මී 3 ක් පමණ දිග සීරීම් තුනක් පවතින බව තහවුරු වේ.

අදාළ සිද්ධිය සිදුවන අවස්ථාවේදී මුළුතැන්ගෙයි රාජකාරී කරමින් සිටි පො.කො 65673 රොබට් මෙල්ස් නිලධාරියා විසින් දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කර ඇති ඇසින් දුටු සාක්ෂිය මඟින්ද වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරී විසින් පැමිණිලිකරුට පහරදුන් බව තහවුරු වේ .

මෙම පහරදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් නුවරඑළිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව මේ වන විට වගඋත්තරකාර පොලිස් නිලධාරීට එරෙහිව නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 187/19 යටතේ කරුණු වාර්තා කර ඇති බවද තහවුරු වේ.

අදාළ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිවරයාගේ නියෝග මත පොලිස් විශේෂ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවේද සඳහන් වන්නේ වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරී විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට කරුණු අනාවරණය වන බවයි.

පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලදී අනාවරණය වන මෙකී සමස්ත කරුණු අනුව හා ඇසින් දුටු සාක්ෂි හා අධිකරණ වෛද්‍ය වාර්තා අනුව වගඋත්තර පාර්ශවීය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දමයන්ත විජය ශ්‍රී යන අය විසින් පැමිණිලිකාර පො.ප දයානන්ද අලහප්පෙරුම මහතාට පහරදීමක් සිදුකර ඇති බව තහවුරු වේ.

**නිගමනය :-**

වගඋත්තරකරු විසින් අදාළ සිද්ධියේදී පැමිණිලිකරුට අසභ්‍ය වචනයෙන් බැණවැදී පහරදීම හේතුවෙන් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති "කෲර අමානුෂික දඬුවමකට හෝ අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොවීමට ඇති මූලික අයිතිවාසිකම" උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තරකාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එච්.ඒ.එන්.කේ දමයන්ත විජය ශ්‍රී යන අය විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තරකාර පාර්ශවයේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත සහ නීතිපතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2022.02.03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan
අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

12/20
ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාසය,
කොටා ටෙරස්,
බොරැල්ල,
කොළඹ 08.

3. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/